# 13 ප්‍රායෝගික ලේඛන

එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවල දී විවිධ ආකෘති පත්‍ර පිරවීමට අපට සිදු වේ. ඒවා නිවැරදි ව පිරවිය යුතු ය. නිවැරදි නොවීම නිසා බොහෝ විට තම කටයුතු අපේක්ෂිත පරිදි ඉටු කර ගැනීමට නොහැකි වනු ඇත. පාසල් වියේ දී ම එවැනි ආකෘති පත්‍ර සකස් කිරීම හා සම්පූර්ණ කිරීම පිළිබඳ ව ඔබේ දැනුම වර්ධනය කිරීම මේ පාඩමේ අරමුණ වේ.

## ආකෘති පත්‍ර සකස් කිරීම

රැකියා සඳහා ඉල්ලුම් කිරීමේ දී ද පුහුණුවීම් සඳහා බඳවා ගැනීමේ දී ද විවිධ තරග සඳහා ඉදිරිපත් වීමේ දී ද අපට ආකෘති පත්‍ර පිරවීමට සිදු වේ. එපමණක් නො ව, බැංකු කටයුතුවල දී, තැපැල් කාර්යාලයේ දී, ගමන් බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේ දී ආදී වශයෙන් විවිධ ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ. මේවා ජීව දත්ත පත්‍රිකා ලෙස ද ව්‍යවහාර වේ. වර්තමානයේ බොහෝ විට මේවා නිර්මාණය වන්නේ පරිගණකය මඟිනි.

පුවත්පත්වල හෝ ගැසට් පත්‍රයේ හෝ පළ කරන දැන්වීම් අනුව ඉල්ලුම් පත්‍ර සකස් කර ගැනීම තමා විසින් ම සිදු කළ යුතු අවස්ථා ද ඇත.

* පහත දක්වෙනුයේ ගැසට් පත්‍රයේ පළ වූ පුහුණු පාඨමාලාවක් පිළිබඳ නිවේදනයක් හා ඊට ඉල්ලුම් කිරීම සඳහා සකසන ලද ආකෘති පත්‍රයකි.

* ඊළඟට ඇත්තේ රැකියා ඇබෑර්තුවක් පිළිබඳ පුවත් පත් දැන්වීමකි.

ඉන් පළමු වන අවස්ථාවේ දී ආදර්ශ ඉල්ලුම් පත්‍රයක් (ආකෘති පත්‍රයක්) ඉදිරිපත් කෙරේ.

දෙ වන අවස්ථාවේ දී ඉල්ලුම් පත්‍රය තමා විසින් ම සකස් කර ගත යුතු ව ඇත.

ඒවා හොඳින් කියවා -

01. පළමු ව දී ඇති අයදුම්පත සම්පූර්ණ කරන්න.

02. දෙවනු ව අදාළ දැන්වීම අනුව අයදුම්පතක් සකස් කර සම්පූර්ණ කරන්න.

**I ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය මොරටුව ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම 2007 වර්ෂය**

පහත සඳහන් අවම සුදුසුකම් ඇති ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයෙන්ම 2007 වර්ෂය සඳහා ඇතුළත් කර ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *(අ) වයස:* 2007.03.31 වැනි දිනට වයස අවුරුදු 16ත් 22ත් අතර විය යුතුය.

   *(ආ)අධ්‍යාපන සුදුසුකම්:* අ. පො. ස. (සා.පෙළ) විභාගයේ දී (අධ්‍යාපන මාධ්‍යය) අනුව සිංහල / දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත්වීම.

   *(ඇ)සැ. යු:-*පහත නම් සඳහන් පුහුණු ආයතනවල දැනට පූර්ණ කාලීන පාඨමාලා හදාරන ආධුනික / ආධුනිකාවන්ට මෙම පුහුණුව සඳහා ඉල්ලුම් කළ නොහැක.

(i) ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව
(ii) මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත.
(iii) ලංකා ජර්මන් දුම්රිය අභ්‍යාස ආයතනය - රත්මලාන

2. *ඇතුළත්වීමේ විභාගය*
පවත්වන මාධ්‍යය - සිංහල සහ දෙමළ භාෂාව වලින්

පුහුණු කිරීමේ උපදෙස් - සියලුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර දැනට තිබෙන පහසුකම් අනුව මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ භාෂාවෙන් ද පැවැත්වේ.

*3. විභාග මධ්‍යස්ථාන* - පහත සඳහන් ආදර්ශ අයදුම්පත් පෝරමය අනුව අයදුම් කරන අය සඳහා ලිඛිත පරීක්ෂණයක් කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල සහ අනුරාධපුරය යන විභාග මධ්‍යස්ථානවල දී පැවැත්වේ. එහෙත් මීට අමතරව යම් පළාතක විභාග අයදුම්කරුවන් 100කට වැඩි ප්‍රමාණයක් සිටී නම් එම පළාතේ විභාග මධ්‍යස්ථානයක් පැවැත්වීමට කටයුතු කරනු ඇත. අවශ්‍ය අවම සුදුසුකම් හා අංක 04 සඳහන් විභාග ගාස්තු එවා ඇති අයදුම්කරුවන් පමණක් ඇතුළත් කිරීමේ විභාගයට කැඳවනු ලැබේ.

*විභාගයට අදාළ විෂයයන්* - ඇතුළත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය සහ කාර්මික ඇඳීම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

*4. විභාග ගාස්තු:* විභාග ගාස්තු වශයෙන් රු: 250 ක් ගෙවිය යුතුය. එම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවිය හැක.

*ගෙවන ක්‍රමය:* ගණකාධිකාරී, ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය, ලංකා බැංකුව, මොරටුව ශාඛාව, ගිණුම් අංක 681490 දරන ගිණුමට මුදල් බැර කළ යුතුය.

ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගිණුම් අංක 681490ට රු: 250 ගෙවා ලබාගත් රිසිට් පත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

ඉහත මුදල් ගෙවා ගත් කුවිතාන්සිය අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුළත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව විශේෂයෙන් සැලකිය යුතුය.

*5. මූලික තෝරා ගැනීම:* ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතම පදනම මත සීමිත සංඛ්‍යාවක් අවසාන තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා සහ සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේදී අඩු පහසුකම් සහිත පළාත් සඳහා ලැබිය යුතු ඉහළම ලකුණු මට්ටම පාලක මණ්ඩලය මගින් තීරණය කරනු ලැබේ. (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ.)

*6. අවසන් තෝරා ගැනීම:* යෝග්‍යතා සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත බඳවා ගනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. යෝග්‍යතා පරීක්ෂණය සඳහා 40% ක් ද, සම්මුඛ පරීක්ෂණය සඳහා 60% ක් ද ලබාගත හැක. බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලැබේ. අනතුරු ව ආයතනයට බඳවා ගත හැකි සංඛ්‍යාව සීමිත බැවින් සමත්වන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයට යටත්ව පුහුණුව සඳහා තෝරා ගනු ලබන අතර, වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත්වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැළකිය යුතුය.

*7. පුහුණු පාඨමාලා*

| | | |
|---|---|---|
| මෝටර් කාර්මික ශිල්පය | - | අවු: 03-04 |
| මිල්රයිට් වැද්දුම් ශිල්පය | - | අවු: 03-04 |
| වායු සමීකරණ/ශීතකරණ ශිල්පය | - | අවු: 03 1/2 |
| බලවිදුලි ශිල්පය | - | අවු: 03 1/2 |
| යාන්ත්‍රික ශිල්පය | - | අවු: 03 1/2 |
| ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පය | - | අවු: 03 |
| වාහන විදුලි ශිල්පය | - | අවු: 02 |
| පෑස්සුම් ශිල්පය | - | අවු: 03 |

මෙම පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබාදෙනුයේ ප්‍රථම වසරේ දී මූලික පුහුණු කාලයට මාස 06 කින් පසුව වෘත්තීය තෝරා ගැනීමේ පරීක්ෂණයේ දී ලබන කුසලතා ප්‍රතිඵල අනුවය.

*8. ගිවිසුම් අත්සන් කිරීම:* ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන්ට ලැබෙන ඒ ඒ වෘත්තීන්ට අදාළව අවුරුදු 04, 03 1/2 සහ 03 ක් වූ පාඨමාලා සාර්ථක ව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමග ගිවිසුම්වලට අත්සන් තැබිය යුතුය.

*9. අයදුම්පත්:* පහත දක්වෙන ආදර්ශ අයදුම්පත් පෝරමයට අනුව තම අයදුම්පත්‍රය පිළියෙල කොට අධ්‍යාපන සහතිකයේ පිටපතක් ද අමුණා ගල්කිස්ස, ගාලු පාරේ, අංක 582 හි ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ පිරිස් කළමණාකාර වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "ලං. ජ. කා. අ. ආ. / 62 /2007" යනුවෙන් සඳහන් කළ යුතු අතර සෑම අයදුම්පතක් ම මි. මී. 210 x 297 (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ගත යුතුයි.

*10. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය:* අයදුම්පත් 2007 / 05 / 23 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පිරිස් කළමනාකරු
ලං. ජ. කා. අ. ආ.

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය,
අංක 582, ගාලු පාර, ගල්කිස්ස.
(අඟුලාන හංදිය අසල)
දුරකථන අංක: 605625

ආදර්ශ අයදුම් පත්‍රය

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය මොරටුව

**ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම 2007**

01. (අ) සම්පූර්ණ නම (සිංහලෙන්) : ..............................................................................
(ඉංග්‍රීසියෙන්) : ..............................................................................
(ආ) (මුලකුරු සමඟ නම) : ..............................................................................
..............................................................................................................

02. (අ) තැපැල් ලිපිනය : ...........................................................
(ආ) දිස්ත්‍රික්කය : ...........................................................
(ඇ) පළාත : ...........................................................

03. (අ) උපන් දිනය: ...........................................................
(ආ) 2007. 03. 31 වැනි දිනට වයස:
අවු: ............................. මාස: .............................. දින: ..............................

04. ස්ත්‍රී / පුරුෂ භාවය: ........................................

05. අධ්‍යාපන සුදුසුකම්:
අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන්:

විභාග අංකය: ............................................. වර්ෂය: ...............................

| විෂයයන් | සාමර්ථ්‍යය | | විෂයයන් | සාමර්ථ්‍යය |
|---|---|---|---|---|
| 1. .................... | ........................... | 5. | .................... | ....................... |
| 2. .................... | ........................... | 6. | .................... | ....................... |
| 3. .................... | ........................... | 7. | .................... | ....................... |
| 4. .................... | ........................... | 8. | .................... | ....................... |

06. ජාතික හෝ තැපැල් හැඳුනුම්පත් අංකය: .......................................................

07. (අ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍යය: .........................
(ආ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානය:
.................................................
(කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුර හෝ පළාත්)

08. (i) මුදල් ගෙවූ ලංකා බැංකු ශාඛාවේ නම: ...........................................................
(ii) මුදල් ගෙවූ දිනය: .................................................

09. ඉහත සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් විස්තරවලින් යමක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව මා තෝරා ගැනීමෙන් පසු පෙනී ගියහොත් පුහුණුවෙන් ඉවත් කර දමනු ලැබීමට හැකිවන බව දනිමි.

.............................................................
අයදුම්කරුගේ / කාරියගේ අත්සන

දිනය: ..............................

**II**

# ඇබෑර්තු

## ගබඩා ලිපිකරු

මීගමුවේ පිහිටි මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කරනු ලබන ප්‍රධාන පෙළේ සමාගමකට වහාම බඳවා ගැනීම සඳහා ගබඩා ලිපිකරුවන් අවශ්‍ය ව ඇත.

අධ්‍යාපන සුදුසුකම්: අ.පො.ස. (උ.පෙළ)

වෘත්තීය සුදුසුකම් : ගබඩා කටයුතු පිළිබඳ දැනුම

වයස : අවු. 25 ට වැඩි.

පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම විශේෂයි. වැටුප් සාකච්ඡා මගින් තීරණය කෙරේ. පහත සඳහන් ලිපිනයට වහාම පැමිණ හෝ ඔබ ඇමතිය හැකි දුරකථන අංක සමග ජීව දත්ත තොරතුරු දින 07ක් ඇතුළත යොමු කරන්න.

කළමනාකරු<br>
පීරිස් සහ සමාගම<br>
තොටුපල පාර, මීගමුව.

දුර. 0331224205

කිසියම් දැන්වීමකට අනුව ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීමෙන් ඒ සම්බන්ධයෙන් ඇති විය හැකි ගැටලු ඔබට බොහෝ දුරට මඟ හරවා ගත හැකි ය.

01. තමා සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වන ආකෘති පත්‍රයට අදාළ දැන්වීමේ සඳහන් විස්තර හා උපදෙස් හොඳින් කියවා, ඉල්ලා ඇති තොරතුරු හා සුදුසුකම් මොනවා ද යි හොඳින් හඳුනා ගැනීම.
02. තමාගේ නම, වයස ආදී තොරතුරු උප්පැන්න සහතිකයේ ඇති ආකාරයට ම සඳහන් කිරීම.
03. සැම විට ම සැබෑ වූත් නිවැරදි වූත් තොරතුරු ඉදිරිපත් කිරීම.
04. අයදුම්කරුගේ අත් අකුරින් ම සම්පූර්ණ කළ යුතු යැයි උපදෙස් දී ඇති විට එසේ කිරීම.
05. පැහැදිලි ව නිවැරදි ව අත් අකුරු ලිවීම.
06. කාර්යාලීය ප්‍රයෝජනය සඳහා යැ යි සඳහන් කොටස හිස් ව තැබීම.
07. සුපුරුදු අත්සන හා දිනය නිවැරදි ව නියමිත තැන්වල යෙදීම.
08 ඉල්ලා ඇති සහතිකවල ඡායා පිටපත් ඇමිණීම.

01. පහත දැක්වෙන්නේ යතුරු පැදි කාර්මික ශිල්පියෙකු ලෙස බඳවා ගැනීම සඳහා පළ කළ දැන්වීමකි.

i. මේ දැන්වීම කියවා අදාළ අයදුම්පත සකස් කර සම්පූර්ණ කරන්න.

## දීපා යතුරුපැදි කාර්මික ශිල්පියෙකු වී දීප්තිමත් අනාගතයක් හිමි කරගන්න.

## මෝටර් සයිකල් කාර්මික ශිල්පීන්

දීපා සහ සමාගමේ අම්පාර පිහිටි සේවා මධ්‍යස්ථානයන්හි මෝටර් සයිකල් අලුත්වැඩියාවන් සඳහා කාර්මික ශිල්පීන් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

- අ. පො. ස. (සා/පෙළ) සමත්ව තිබිය යුතු ය.
- පිළිගත් ආයතනයක මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබිය යුතු ය.
- මෝටර් සයිකල් අලුත්වැඩියාව පිළිබඳ වසර 2ක පළපුරුද්දක් අවශ්‍ය ය.
- වයස අවුරුදු 35ට අඩු විය යුතු ය.

තෝරාගනු ලබන අයදුම්කරුවන්ට සිත්ගන්නාසුලු වැටුපක් හා සමාගම මඟින් ලබාදෙන අනෙකුත් දීමනා හිමිවනු ඇත. ඔබගේ සියලු විස්තර හා සුදුසුකම් ඇතුළත් කළ අයදුම්පත්, ඔබ පිළිබඳ විස්තර විමසිය හැකි නෑදෑ නොවන දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිත ව ඉදිරි දින 10 ඇතුළත පහත සඳහන් ලිපිනයට ලැබීමට සලස්වන්න.

අපේ වෙබ් අඩවිය මඟින් ද ඔබට මේ සඳහා අයදුම් කළ හැකි ය.

කළමනාකරු මානව සම්පත්
දීපා සහ සමාගම
3 හරස් වීදිය
කොළඹ 02.

**ii.** **පහත සඳහන් දැන්වීමට අදාළ අයදුම්පත සකස් කර සම්පූර්ණ කරන්න.**

<u>ජෝන් සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම</u>

<u>423, ඉසිපතන මාවත, කොළඹ 05.</u>

අප ආයතනයේ සේවය සඳහා ගිණුම් ලිපිකරුවන් බඳවා ගැනීම පිණිස පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සුදුසුකම්

(අ) 2007. 12. 31 දිනට වයස අවුරුදු 16-20 ත් අතර විය යුතු ය.

(ආ) භාෂාව (සිංහල/දෙමළ) ගණිතය සම්මාන සහිත ව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් සමත් ව තිබීම.

02. විශේෂ සුදුසුකම්

(අ) අ.පො.ස.(සා/පෙළ) විභාගයේ වාණිජ විෂය සමත් ව තිබීම.

(ආ) පරිගණක භාවිතය හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම.

(ඇ) ගිණුම් ලිපිකරුවකු ලෙස පළපුරුද්ද.

වැටුප සාකච්ඡා මාර්ගයෙන් තීරණය කරගත හැකි ය.

ඔබගේ සියලු විස්තර සුදුසුකම් ඇතුළත් අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් අමුණා ඔබ පිළිබඳ තොරතුරු විමසිය හැකි, නෑදෑ නොවන දෙදෙනකුගේ නම් සහ ලිපිනයන් සහිත ව 2005. 12. 31 දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවන්න.

පිරිස් කළමනාකරු
ජෝන් සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම,
423, ඉසිපතන මාවත,
කොළඹ - 05.

ජේ. ඒ. ධර්මරත්න
පිරිස් කළමනාකරු

දිනය: 2005. 10. 30

**iii.** මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍ර සම්පූර්ණ කරන්න.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

තැ.කා.සි
அ.அ.சி. } 1
P.O.C.

(M 8* S,T.&E.) 11/83

## මෙරට සාමාන්‍ය මුදල් ඇණවුම් ඉල්ලුම් පත්‍රය
## உள்நாட்டுச் சாதாரண காசுக்கட்டளை விண்ணப்பம்
## APPLICATION FOR INLAND ORDINARY MONEY ORDER

| | මුදල<br>தொகை<br>AMOUNT | රු.<br>ரூ.<br>Rs. } .................. | ශ.<br>ச.<br>c. } ............ | අංකය<br>இல.<br>No. } ........ |
|---|---|---|---|---|

රුපියල් (අකුරෙන්)
ரூபா. (சொல்லில்)
Rupees (in Words) } ______________________

මුදල් ලබාගන්නා කාර්යාලය
பணம் கொடுபட வேண்டிய இடம்
Payable at } ______________________

ලබන අය (මුලකුරු සමග)
பெறுபவரின் பெயர்
(முதல் எழுத்துகளுடன்)
Name of Receipient (with initials) } ______________________

යවන්නාගේ නම (මුලකුරු සමග)
அனுப்புபவரின் பெயர்
(முதல் எழுத்துகளுடன்)
Name of Remitter (with initials) } ______________________

යවන්නාගේ ලිපිනය
அனுப்புபவரின் முகவரி
Address of Remitter } ______________________

දිනය
திகதி
Date } ____________

______________________
අත්සන/கையொப்பம்/Signature

අ.පි.බ./ம.ப.பா./P.T.O.

H024879 – 5,00,000 (2005/12) P ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

තැ. කා. ආකෘ. 51
அ. அ. எண். 51
P. O. N. 51
(F° S., T. & E.) 3/69

# තැපැල් හැඳින්වීම් පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රය

## அஞ்சல் அறிமுக அட்டை பெறுவதற்கான விண்ணப்பம்

## APPLICATION FOR A POSTAL IDENTITY CARD

දිනය/திகதி/Date :.............................

Through the Postmaster,.................................................... තැපැල් ස්ථානාධිපති මාර්ගයෙන්/அஞ்சல் அதிபருக்கூடாக

පෝස්ට් මාස්ටර් ජනරාල් වෙතටයි.
அஞ்சல் அதிபர் நாயகம் அவர்களுக்கு
To: the Postmaster-General.

මා වෙත තැපැල් හැඳින්වීම් පත්‍රයක් නිකුත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි. මෙහි පහත මා විසින් සපයා ඇති තොරතුරු සත්‍යවූ ද නිවැරදිවූ ඒවා බවද දැනට මා සතුව තැපැල් හැඳින්වීම් පත්‍රයක් නොමැති බව ද සහතික කොට ප්‍රකාශ කරමි. මෑතදී ගත්තා ලද පැහැදිලි ඡායාරූප පිටපත් දෙකක් මේ සමග අමුණා ඇත.

எனக்கு ஒரு அஞ்சல் அறிமுக அட்டை வழங்குமாறு இதனால் விண்ணப்பிக்கிறேன். இதன்கீழ் நான் கொடுக்கும் விபரங்கள் யாவும் உண்மையானவையும் சரியானவையுமென்றும், நான் இப்போது ஒரு அஞ்சல் அறிமுக அட்டை வைத்திருக்கவில்லையென்றும் உறுதிப்படுத்துகிறேன். அண்மையில் எடுத்த எனது புகைப்படத்தின் தெளிவான இரண்டு பிரதிகள் இதனுடன் இணைக்கிறேன்.

I hereby apply for the issue of a Postal Identity Card to me. I declare that the information furnished by me below is true and correct and that I am not already a holder of a Postal Identity Card. I attach hereto two clear copies of a recent photograph.

1. සම්පූර්ණ නම / முழுப்பெயர் / Name in full ...................................................
(පැහැදිලි අකුරෙන්/தனித்தனி எழுத்துக்களில்/In block letters)
2. පියාගේ සම්පූර්ණ නම / தகப்பனாரின் முழுப்பெயர் / Father's name in full ...................................................
3. ඉල්ලුම්කරුගේ රක්ෂාව / விண்ணப்பதாரரின் தொழில் / Applicant's profession ...................................................
4. ස්ථිර පදිංචිය / நிரந்தர வதிப்பிடம் / Permanent residence ...................................................
5. ජාතිය / சாதியம் / Nationality ....................
6. උපන් දිනය / பிறந்த திகதி / Date of birth ....................
7. උස / உயரம் / Height ....................
8. හිසකේ පිළිබඳ විස්තර / தலைமயிரின் விபரம் / Description of hair ....................
9. ශරීර වර්ණය හා විශේෂ ලකුණු / நிறமும் விசேட அடையாளங்களும் / Complexion and special marks

...................................................

...................................................

අත්සන (1) / கையொப்பம் (1) / *Signature (1)* ....................

ඉල්ලුම්කරුගේ ඡායාරූප පිටපතක් ($3\frac{1}{4}'' \times 2\frac{1}{4}''$ ළඬවඳ කය පමණයි) මෙහි අලවා තැපැල් ස්ථානාධිපති සහ සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරිපිට ඒ මත අත්සන් කළ යුතුය.

விண்ணப்பதாரரின் (மேலுருப்பும் முகமும் மார்பும் மாத்திரம் $3\frac{1}{4}'' \times 2\frac{1}{4}''$) புகைப்படப் பிரதியொன்று இங்கிடத்தில் ஒட்டப்பட்டு அஞ்சல் அதிபரினதும் இரு சாட்சிகாரரினதும் முன்னிலையில் கையொப்பமிடப்படவேண்டும்.

One copy of applicant's photograph (bust only $3\frac{1}{4}'' \times 2\frac{1}{4}''$) to be pasted here and autographed in the presence of the Postmaster and two witnesses.

(සැ.යු.—මෙහි අත්සන් කළ යුත්තේ කොටසක් ආකෘති පත්‍රයෙහි ද අනෙක් කොටස ඡායාරූපය මතුපිට ද සිටිනසේය.)

(குறிப்பு.—கையொப்பத்தில் ஒரு பகுதி பத்திரத்திலும் மற்றப்பகுதி புகைப்படத்திலும் வைத்தல் வேண்டும்.)

(*Note*.—The signature here should be partly on the form and partly on the photograph.)

පෝ. මා. ජ. කාර්යාලයේ ප්‍රයෝජනය පිණිසයි
அ.அ.நா. அலுவலகத்தின் உபயோகத்திற்கு
FOR THE USE OF THE P.M.G'S OFFICE

...................................................

අත්සන (2) / கையொப்பம் (2) / *Signature (2)*

සැ.යු.—මෙහි නැවත වරක් අත්සන් කළ යුතුයි.
குறிப்பு.—கையொப்பம் திரும்பவும் இவ்விடத்தில் வைத்தல் வேண்டும்.
*Note*.—The signature should be repeated here.

## ක්‍රියාකාරකම 02

**පහත දැක්වෙන ආකෘති පත්‍ර ද සම්පූර්ණ කිරීමට ඉගෙන ගන්න.**

01. උප්පැන්න සහතිකයේ පිටපතක් ලබා ගැනීම සඳහා
02. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් ජාතික හැඳුනුම් පතක් ලබා ගැනීම සඳහා
03. බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා
04. මෝටර් බයිසිකලයක ආදායම් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා